27 AUG 1987

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1987 අංක 25 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 මැයි මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1987 මැයි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි.    තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1987 අංක 25 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 මැයි මස 21 වන දින.]

එල්. ඩී.—ඕ. 32/86.

**1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1987 අංක 25 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1984 අංක 38 දරන පනතින් සංශෝධිත පරිදි වූ (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනතේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1980 අංක 27 දරන පනතේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) එම උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(අඅ) නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (රසායනාගාර සේවා) ;" ;

(ආ) එම උපවගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(උඋ) ශික්ෂණ රෝහල් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, එම අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයෙක් ;" ;

(ඇ) එම උපවගන්තියේ (ට) ඡේදයේ ඇති "කාය වෛද්‍යවරුන්ගේ විද්‍යාලය විසින් නම් කරනු ලබන ඒ විද්‍යාලයේ නියෝජිතයෙක් ; සහ" යන වචන වෙනුවට "කාය වෛද්‍යවරුන්ගේ විද්‍යාලය විසින් නම් කරනු ලබන ඒ විද්‍යාලයේ නියෝජිතයෙක් ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) එම උපවගන්තියේ (ඩ) ඡේදයේ ඇති "ශ්‍රී ලංකා ප්‍රසව වෛද්‍යවරුන්ගේ සහ ස්ත්‍රී චිකිත්සා වෛද්‍යවරුන්ගේ විද්‍යාලය විසින් නම් කරනු ලබන ඒ විද්‍යාලයේ නියෝජිතයෙක්." යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ප්‍රසව වෛද්‍යවරුන්ගේ සහ ස්ත්‍රී චිකිත්සක වෛද්‍යවරුන්ගේ විද්‍යාලය විසින් නම් කරනු ලබන ඒ විද්‍යාලයේ නියෝජිතයෙක් ;" යන වචන ආදේශ කිරීමෙන් ;

2—ඒ 095860— 7,265 (87/02)

(ඉ) එම වගන්තියේ (ඬ) ඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන ඡේද එකතු කිරීමෙන්—

"(ණ) ශ්‍රී ලංකා දන්ත වෛද්‍යවරුන්ගේ සංගමය විසින් නම් කරනු ලබන එම සංගමයේ නියෝජිතයෙක්; සහ

(ත) ඖෂධ වෙළඳුන්ගේ සංගමය විසින් නම් කරනු ලබන එම සංගමයේ නියෝජිතයෙක්."; සහ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි "(1) වන උප වගන්තියෙහි (එ), (ඒ), (ඔ), (ඕ), (ක), (ග), (ච), (ජ), (ට) හෝ (ඩ) ඡේදයන්" යන යෙදුම වෙනුවට "(1) වන උපවගන්තියෙහි (එ), (ඒ), (ඔ), (ඕ), (ක), (ග), (ච), (ජ), (ට), (ඩ), (ණ) හෝ (ත) ඡේදයන්" යන යෙදුම ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය එහි "උපකරණ" යන්නෙහි අර්ථ නිරූපණයෙහි එන "ඖෂධයක් ඇතුළත් නොවේ" යන වචන වෙනුවට "යම් ආයුර්වේද උපකරණයක්, හෝමියෝපති උපකරණයක් හෝ ඖෂධයක් ඇතුළත් නොවේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.